# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.04.12 පැය 2200 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/600/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**මාතර කොට්ඨාසයේ නිලධාරීන් සඳහා දේශන ශාලාවක් සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක නිළ නිවස විවෘත කිරීම.**

මාතර කොට්ඨාසයේ නිලධාරීන් සඳහා නිලධාරීන් 300 කට අසුන් ගැනීමට හැකිවන පරිදි නවීන තාක්ෂණයට අනුව අංග සම්පූර්ණ වායු සමීකරණය කරන ලද දේශන ශාලාවක් සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක නිළ නිවස විවෘත කිරීම 2026.04.12 දින සවස් කාලයේ මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ආනන්ද විජේපාල මහතගේ ප්‍රධානත්වයෙන් හා පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතාගේ සහභාගිත්වයෙන් මාතර පොලිස් ස්ථාන භූමියේදී පැවැත්විණි.

මෙම අවස්ථාවට සමගාමීව මාතර දිස්ත්‍රික්කයේ අහංගම, කොටවිල හා දික්වැල්ල පොලිස් ස්ථාන, ගාල්ල දිස්ත්‍රික්කයේ ඌරගස්මංහන්දිය, අහුංගල්ල, හික්කඩුව හා අක්මීමන පොලිස් ස්ථාන, හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස, මත්තල හා කිරින්ද පොලිස් ස්ථාන වල ස්ථානාධිපතිවරුන්ගේ පොලිස් නිළ නිවාස ද විවෘත කිරීම සිදුවිය.

මෙම අවස්ථාවට දකුණු පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කිත්සිරි ජයලත්, මාතර හම්බන්තොට දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති චාමික වික්‍රමසිංහ, ගාල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති එච්.සී.ඒ. පුෂ්පකුමාර, මාතර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වසන්ත ජයමිණි කුමාර, ගාල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ.එස්.කේ. රූපසිංහ, ඇල්පිටිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලකී රන්දෙණිය හා තංගල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිපුන දෙහිගම යන මහත්වරුන් ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ඇතුළු පොලිස් නිලධරයන් විශාල පිරිසක් සහභාගි විය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

## மாத்தறை மாவட்டத்தில் விரிவுரைக் மண்டபம் மற்றும் பிரதான பொலிஸ் பரிசோதகரின் உத்தியோகபூர்வ இல்லம் திறப்பு

மாத்தறை மாவட்டத்தில் பணிபுரியும் பொலிஸ் அதிகாரிகள் பயன்பெறும் வகையில், 300 பேர் அமரக்கூடிய வகையில் நவீன தொழில்நுட்பத்துடன் முழுமையாக குளிரூட்டப்பட்ட புதிய விரிவுரைக் கூடம் மற்றும் பிரதான பொலிஸ் பரிசோதகரின் உத்தியோகபூர்வ இல்லம் 2026.04.12 மாலை திறந்து வைக்கப்பட்டது.

இந்த நிகழ்வு, பொது மக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற விவகாரங்கள் அமைச்சர் ஆனந்த விஜேபால அவர்களின் தலைமையிலும், பொலிஸ் மாஅதிபர் சட்டத்தரணி பிரியந்த வீரசூரிய அவர்களின் பங்கேற்பிலும் மாத்தறை பொலிஸ் நிலைய வளாகத்தில் நடைபெற்றது.

இதற்கிணங்க, மாத்தறை மாவட்டத்தின் அஹுங்கம, கொட்டவில, திக்வெல்ல பொலிஸ் நிலையங்கள்; காலி மாவட்டத்தின் ஊரகஸ்மான்ஹந்திய, அஹுங்கல்ல, ஹிக்கடுவ, அக்மீமன பொலிஸ் நிலையங்கள்; மற்றும் ஹம்பாந்தோட்டை மாவட்டத்தின் அங்குணகொலபெலஸ்ஸ, மத்தல, கிரிந்த பொலிஸ் நிலையங்களில் நிலையப் பொறுப்பதிகாரிககளின் உத்தியோகபூர்வ இல்லங்களும் திறந்து வைக்கப்பட்டன.

இந் நிகழ்வில் தென் மாகாணப் பொறுப்பான சிரேஷ்டப் பிரதிப் பொலிஸ் மா அதிபர் கித்சிரி ஜயலத் அவர்கள், மாத்தறை-ஹம்பாந்தோட்டை பிராந்தியத்திற்குப் பொறுப்பான பிரதிப் பொலிஸ் மா அதிபர் சாமிக விக்ரமசிங்க அவர்கள் , மாத்தறை பிரிவிற்குப் பொறுப்பான சிரேஷ்டப் பொலிஸ் அத்தியட்சகர் வசந்த ஜயமினி குமார உள்ளிட்ட பல சிரேஷ்டப் பொலிஸ் அதிகாரிகள் மற்றும் பெருந்தொகையான பொலிஸ் அதிகாரிகள் கலந்து கொண்டனர்.

**பொலிஸ் ஊடகப் பிரிவு**